# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ ප්‍රමුඛ ආයතනය සමඟ
## ඔබේ හැකියාවන් බෙදාගන්න

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යනු සංචාරක ව්‍යාපාරය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා පැවරී ඇති රජයේ අධිකාරිය වේ. සංචාරක ක්ෂේත්‍රයේ අනාගතය සඳහා ජාතික ආර්ථිකයට තීරණාත්මක දායකත්වයක් සපයන්නෙකු ලෙස හඳුනාගෙන ඇත. මෙම අංශය ඉහළම සෘජු විදේශ ආයෝජන සහ ඉහළ මට්ටමේ ආයෝජක ව්‍යාපෘතිද රට වෙත ආකර්ෂණය කරයි.

අධිකාරියේ පවතින පහත දැක්වෙන පුරප්පාඩුව සඳහා සුදුසුකම් ලත් අය වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | තනතුර | සේවා කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | සහකාර අධ්‍යක්ෂ / ප්‍රසම්පාදන | MM 1-2 | 01 |

උනන්දුවක් දක්වන අයදුම්කරුවන් පහත මාර්ගෝපදේශ පිළිපැදිය යුතුය:

• අවශ්‍ය සුදුසුකම් ඇතුළත් විස්තරාත්මක රැකියා දැන්වීම SLTDA වෙබ් අඩවියේ "Careers" ප්‍රවේශය යටතේ ලබාගත හැක – http://www.sltda.gov.lk/en/careers.

• තනතුරට අදාල අයදුම්පත්‍රය ඉහත වෙබ් පිටුවෙන් බාගත කර අපේක්ෂා කරන තනතුරට අදාලව පුරවා සම්පූර්ණ කල යුතුය.

• සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.

• තනතුරෙහි කාර්යයන් කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට යෝග්‍ය ශාරීරික හා මානසික මට්ටමක සිටිය යුතු අතර, රටේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

• සම්පූර්ණ කරන ලද අයදුම්පත අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්දට අදාල සහතික කළ පිටපත් හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ ඇමතුම් තොරතුරු සමඟ 2026.03.05 වන දින හෝ ඊට පෙර සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, නො: 80, ගාලු පාර, කොළඹ 03 ලිපිනය වෙත ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කල යුතුය.

• රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා ඉදිරිපත් කල යුතුය.

ඉහත අවශ්‍යතා සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අවම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය අධිකාරී කළමනාකාරීත්වය සතුය. කිසියම් ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සේවක අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය**

තෝරාපත්වන අයදුම්කරුවන් තම වැටුපෙන් 10%ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතුය. අධිකාරිය විසින් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) 15% ක් සහ සේවක භාරකාර අරමුදලට (ETF) 3%ක් දායක වනු ඇත.

**වැටුප**

2025 අප්‍රේල් 01 සිට ක්‍රියාත්මක වන **කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2025** අනුව වැටුප් ගෙවනු ලැබේ.

පුරප්පාඩු පිරවීම හා බඳවාගැනීම් සම්බන්ධයෙන් අධිකාරිය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණය වේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය,**
**අංක 80, ගාලු පාර, කොළඹ 03.**

**ප්‍රකාශිත දිනය 2026.02.20**

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

### ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ ප්‍රමුඛ ආයතනය සමඟ
### ඔබේ හැකියාවන් බෙදාගන්න

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යනු සංචාරක ව්‍යාපාරය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා පැවරී ඇති රජයේ අධිකාරිය වේ. සංචාරක ක්ෂේත්‍රයේ අනාගතය සඳහා ජාතික ආර්ථිකයට තීරණාත්මක දායකත්වයක් සපයන්නෙකු ලෙස හඳුනාගෙන ඇත. මෙම අංශය ඉහළම සෘජු විදේශ ආයෝජන සහ ඉහළ මට්ටමේ ආයෝජක ව්‍යාපෘතිද රට වෙත ආකර්ෂණය කරයි.

අධිකාරියේ පවතින පහත දැක්වෙන පුරප්පාඩුව සඳහා සුදුසුකම් ලත් අය වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | තනතුර | සේවා කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | සහකාර අධ්‍යක්ෂ / ප්‍රසම්පාදන | MM 1-2 | 01 |

**සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය/ ව්‍යාපාර කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ වාණිජ්‍ය සම්බන්ධ විෂය ක්ෂේත්‍රයකින් උපාධිය ලබා තිබීම.

හෝ

උක්ත විෂය ක්ෂේත්‍රයන්ට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගත් කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

උපාධිය/ ප්‍රවීණතා සහතිකය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

* ප්‍රසම්පාදන විෂය සම්බන්ධ සහතික ලත් පාඨමාලාවක් හෝ ඩිප්ලෝමාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

අභයන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කණිෂ්ඨ කළමනාකරණ (JM1-2) II ශ්‍රේණියේ සේවා ගණයෙහි අදාළ කේෂ්ත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප**
MM 1-2 2025 රු. 94,190/- 10 x රු. 2,480/- 15 x රු. 3,450/- රු 170,720/- + (ජීවන වියදම් දීමනාව)

**ප්‍රතිලාභ**

- සේවකයා සහ පවුල අවරණය වන ආකර්ශණීය වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්
- වෘත්තීය දියුණුව සඳහා පුහුණුව
- ප්‍රවාහන දීමනා
- සන්නිවේදන දීමනා
- වෘත්තීය දීමනා
- ණය පහසුකම්

**සභාපති,**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය,**
**නො 80, ගාලු පාර, කොළඹ 03.**

ප්‍රකාශිත දිනය : **2026.02.20**